ආගම් විරෝධී ප්‍රකාශයක් කළ බවට වන චෝදනාව මත, ප්‍රහසන ශිල්පිනියක් වන නතාෂා එදිරිසූරියව කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී මැයි 28, 2023 දින අත්අඩංගුවට ගැනීමේ සිදුවීම, මාධ්‍ය තුළ ප්‍රමුඛ අවධානයක් ලබාගත් පුවතක් වූ බව නිරීක්ෂණය කළ හැකි විණි.
මේ සම්බන්ධයෙන්, මැයි 29, 2023 දින සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් සිරස්තල තුළ ඉදිරිපත් වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.
* බොහෝ සිරස්තල ඔස්සේ, සැක පිට අත්අඩංගුවට ගැනුණු නතාෂා එදිරිසූරිය, එම චෝදනා එල්ල වී ඇති වරද නිශ්චිතවම සිදු කළ බවක් දක්වයි.
* ඇතැම් සිරස්තල ඔස්සේ, ඇයව එම චෝදනා එල්ල වී ඇති වරද සම්බන්ධයෙන් සැක පිට පමණක් අත්අඩංගුවට ගැනී ඇති බව දක්වයි.
ඔබ සිතන ලෙසට,
1) යම් චෝදනාවක් පිළිබඳව සැකපිට පමණක් අත්අඩංගුවට ගැනී ඇති, තවමත් නීතියෙන් වරදකරුවෙකු වී නැති අයෙකු, වරදකරුවෙකු ලෙසින් සිරස්තල ඔස්සේ දැක්වීම, මාධ්‍ය සදාචාරය උල්ලංඝනය කිරීමක් නොවන්නේ ද?
2) මෙම සිදුවීමේ ස්වභාවයත්, එසේම සමාජ මාධ්‍ය හරහා මෙයට ලැබුණු අවධානයත් සලකන විට, බොහෝ පුවත් සිරස්තල සැකකරු නිශ්චිතව ම එම වරද කළ බවක් හැඟවෙන ලෙසින් වාර්තා කර තිබූ ආකාරය, සැක පිට පමණක් අත්අඩංගුවට ගත් අයෙකු දූෂ්ටත්වයකින් දැක්වීමක් (Demonisation) සහ, වරදකරුවෙකු බවට මාධ්‍ය විසින් තීන්දුවක් ලබාදීමක් (Trial by media) නොවන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# ආගම් විරෝධී ප්‍රකාශයක් කළා යැයි වන චෝදනාව මත නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම: පුවත් සිරස්තල



















මැයි 29, 2023 දින තෝරාගත් සිංහල පුවත්පත් සිරස්තල දත්ත ඇසුරිණි

ETHICS EYE

# ආගම් විරෝධී ප්‍රකාශයක් කළා යැයි වන චෝදනාව මත නතාෂා එදිරිසූරිය අත්අඩංගුවට ගැනීම: පුවත් සිරස්තල

ETHICS EYE
පිටු මායිමෙන් ඔබ්බට



INSULTING REMARKS ON BUDDHA

**NATASHA REMANDED TILL JUNE 7**

- CID SAYS WILL BE CHARGED UNDER ICCPR ACT
- BAIL REQUEST BY SALIYA PEIRIS AND TEAM REFUSED

Daily News

බුදුන් පිළිබඳව අපහාසාත්මක ප්‍රකාශ: නතාෂා ජුනි 7 දක්වා රිමාන්ඩ් භාරයට. (සිංහලට පරිවර්තනය - **Ethics Eye**)

**Comedian arrested at BIA**

The Island



Natasha

ප්‍රහසන ශිල්පිනිය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේදී අත්අඩංගුවට.

(සිංහලට පරිවර්තනය - **Ethics Eye**)

**NATHASHA EDIRISOORIYA REMANDED TILL JUNE 7**

- NATHASHA WAS ARRESTED BY THE CID AT THE BIA ON SATURDAY NIGHT WHILE ATTEMPTING TO LEAVE THE COUNTRY



නතාෂා එදිරිසූරිය ජුනි 7 දක්වා රිමාන්ඩ් භාරයට.

(සිංහලට පරිවර්තනය - **Ethics Eye**)

DailyMirror

CEYLON TODAY | the morning යන පුවත්පත් මෙම පුවත වාර්තා කර නොතිබුණි.

මැයි 29, 2023 දින තෝරාගත් ඉංග්‍රීසි පුවත්පත් සිරස්තල දත්ත ඇසුරිණි.